
# පුවත්පත් නිවේදනය

## 2015 වසර තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

### දළ ලිඛිත වාරිකය


රක්ෂණ සමාගම්වල දීර්ඝ කාලීන මෙන්ම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යන අංශ දෙකෙහිම දළ ලිඛිත වාරිකයෙහි (GWP) වර්ධනයක් පෙන්නුම් කළ 2015 වසර, ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය සඳහා තවත් ධනාත්මක වසරක් විය.

2015 වසරේ දී රුපියල් මිලියන 122,390ක් වන දීර්ඝ කාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ සඳහා මුළු දළ ලිඛිත වාරිකය, 2014 වසරේ දී එම අගය වූ රුපියල් මිලියන 105,399ට සාපේක්ෂව, 16.12%ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2015 වසර තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය රුපියල් මිලියන 68,815ක (2014: රු.මිලියන 60,803) වාරික ආදායමක් වාර්තා කළ අතර, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය වාර්තා කළ වාරික ආදායම රුපියල් මිලියන 53,575 (2014: රු. මිලියන 44,596) කි. මෙසේ, 2014 වසර හා සසඳන කළ 2015 වර්ෂයේදී පිළිවෙලින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායමෙහි 20.13%ක සහ 13.18%ක වර්ධනයක් පිළිබිඹු විය.




### මුළු වත්කම්

2014 වසර අවසානයේ දී වාර්තා වූ අගය වූ රුපියල් මිලියන 421,407 හා සසඳන කල 2015 දෙසැම්බර් 31 දිනට වාර්තා වූ රක්ෂණ සමාගම් විසින් දරන ලද මුළු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 464,944ක් වූයේ 10.33%ක වර්ධනයක් පෙන්නුම් කරමිනි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 157,001ක් (2014: රුපියල් මිලියන 173,964) වූ අතර, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර වල වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 305,897ක් (2014 : රුපියල් මිලියන 247,061) විය. ඒ අනුව, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල වත්කම්හි වර්ධන වේගයේ 9.75%ක පසුබෑසීමක් ද දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරවල වත්කම්හි 23.81%ක සැලකිය යුතු වර්ධනයක් ද දක්නට ලැබුණි.




## රජයේ සුරැකුම්පත්වල ආයෝජනය

2015 අවසානය වන විට, රජයේ ණය සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ රක්ෂණ සමාගම්වල මුළු දීර්ඝ කාලීන වත්කම් ප්‍රමාණය වූ රුපියල් මිලියන 136,832, 44.73%ක ප්‍රමාණයක් (2014 : රුපියල් මිලියන 111,153: 44.99%) නියෝජනය කළ අතර, එසේ ආයෝජනය කර තිබූ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි මුළු වත්කම් ප්‍රමාණය වූ රුපියල් මිලියන 38,042, ප්‍රතිශතයක් ලෙස 24.23%ක් (2014: රුපියල් මිලියන 31,770; 18.26%) නියෝජනය කර තිබේ. ඒ අනුව, 2015 දෙසැම්බර් 31 දිනට, රජයේ ණය සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල මුළු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 174,874ක් (2014: රුපියල් මිලියන 142,923) විය.

## ආරවුල් නිරාකරණය සහ විමර්ශනය

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමේ අරමුණින් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ඔප්පු යටතේ වන රක්ෂණ හිමිකම් ඉල්ලීම් වලට අදාළ රක්ෂණ ඔප්පු හිමියන්ගේ දුක්ගැනවිලි සම්බන්ධයෙන් විමර්ශන සිදු කරනු ලබයි. තවද, රක්ෂණ සමාගමකට, රක්ෂණ තැරැව්කාර සමාගමකට හෝ රක්ෂණ නියෝජිතවරයෙකුට එරෙහිව කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන්ද රක්ෂණ මණ්ඩලය විමර්ශනයන් සිදු කරනු ලබයි. 2015 වසර තුළ එවැනි ආරවුල් පිළිබඳ නව පැමිණිලි 266ක් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙතට යොමු කර තිබුණි. පසුගිය වසරවල දී ලැබුණු පැමිණිලිද ඇතුළුව, 2015 වසරේදී එවැනි පැමිණිලි 274ක් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නිරාකරණය/විමර්ශන අවසන් කර තිබුණි. නිරාකරණය කරනු ලැබූ පැමිණිලි අතුරින්, පැමිණිලි 54ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මැදිහත්වීම මත රක්ෂණකරුවන් විසින් අදාල හිමිකම් ගෙවීමට කටයුතු යොදන ලදී. එලෙස රක්ෂණ මණ්ඩලයේ මැදිහත්වීම මත රක්ෂණ ඔප්පුහිමියන් වෙත ගෙවන ලද හිමිකම්හි මුළු අගය රුපියල් මිලියන 28.3ක් පමණ වේ.

**රක්ෂණකරුවන්**

2015 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක රක්ෂණ සමාගම් (රක්ෂණකරුවන්) 30 අතුරින්, 03ක් සංයුක්ත සමාගම් ද (සාමාන්‍ය සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර දෙකෙහිම යෙදී සිටින), 15ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සිදුකරන සමාගම් ද, 12ක් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර පමණක් සිදුකරන සමාගම් ද වේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කරගෙන යනු ලැබූ සමාගම් 02ක් 2016 වසරේදී ඒකාබද්ධ වුණු අතර දැනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල යෙදී සිටින සමාගම් ගණන 14කි.

**රක්ෂණ තැරැව්කරුවන්**

2015 වසර තුළ, රක්ෂණ තැරැව්කාර සමාගම් 57ක් වෙළඳපල තුළ ක්‍රියාත්මක විය. රක්ෂණ තැරැව්කාර සමාගම්, රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරවල නිරතවීම පිණිස පනතෙහි 82වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රක්ෂණ සමාගම සමඟින් ලියාපදිංචිව සිටී. පසුගිය වර්ෂවල පරිද්දෙන්ම, 2015 වසරේ දී ද දීර්ඝ කාලීන ව්‍යාපාරය සඳහා වූ රක්ෂණ තැරැව්කරුවන්ගේ දායකත්වය නොවැදගත් වූවක් විය. කෙසේ වෙතත්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හරහා උත්පාදනය වූ වාරික ආදායම මගින්, සාමාන්‍ය රක්ෂණ වෙළඳපලෙහි අතරමැදියෙකු ලෙස තැරැව්කරුවන්ගේ ඇති වැදගත්කම පෙන්නුම් කරයි.

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළව රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උත්පාදනය වූ වාරික ආදායම රුපියල් මිලියන 206ක් (2014: රුපියල් මිලියන 158) වූ අතර, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළව  උත්පාදනය වූ වාරික ආදායම රුපියල් මිලියන 16,124 (2014: රුපියල් මිලියන 14,559) ක් විය. රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර යන දෙකින්ම උත්පාදනය වූ මුළු වාරික ආදායම, පූර්ව වර්ෂයේ එකී ආදායම වූ රුපියල් මිලියන 14,717ට සාපේක්ෂව, 2015 වසරේ දී රුපියල් මිලියන 16,330 කි. ඒ අනුව, 2014 වසරට සාපේක්ෂව, 2015 වසරේ දී, රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර හරහා උත්පාදනය වූ මුළු වාරික ආදායම 10.96%ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

සවිස්තරාත්මක විශ්ලේෂණයක් අපගේ වෙබ් අඩවිය (http://www.ibsl.gov.lk/images/ibsl_statistical_review_2015.pdf) ඔස්සේ ලබාගත හැක.

*සටහන:*

1) *2015 - යාවකාලීන සංඛ්‍යා*
2) *2014 - පුනර්යුක්ත විගණිත සංඛ්‍යා (ජාතික රක්ෂණ භාරකාර අරමුදලෙහි තොරතුරු හැර.)*
3) *මුළු වත්කම් - බැහැර කරන ලද  අන්තර් බණ්ඩ ශේෂයන් (එනම් දීර්ඝ කාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ බණ්ඩයන් අතර ගනුදෙනු) ඉවත් කර ඇත.*


**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය**

11 වන මහල, නැගෙනහිර කුළුන

ලෝක වෙළඳ මධ්‍යස්ථානය

කොළඹ 01.

| | |
|---|---|
| දුරකතන : **011 2396184- 9** | ෆැක්ස් : **011 2396190** |
| වෙබ් අඩවිය : **www.ibsl.gov.lk** | විද්‍යුත් ලිපිනය : **info@ibsl.gov.lk** |


13/07/2016